**කොළඹ විශ්වවිද්‍යාලයය,ශ්‍රී ලංකාව**
**නීති පීඨය**
**නීතිවේදී උපාධි පරීක්ෂණය (පළමු වසර)-2022**

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය-I

(කාලය පැ තුනයි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව: 06

ඕනෑම **ප්‍රශ්න තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.
(විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.)

---

1. පාලකයින්ව බලය අයුතු ලෙස භාවිතා කිරීමෙන් වළක්වාලීමට සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීම පිණිස නීතියේ ආධිපත්‍යය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය අතර පවතින අනුපූරක සහසම්බන්ධය අත්‍යාවශ්‍ය වන බවට පොදුවේ එකඟවනු ලැබේ. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීතියේ ආධිපත්‍යය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය අතර ඇති මෙකී අනුපූරක සහසම්බන්ධතාවයට සහයෝගය නොදක්වයි.
   ඔබ එකඟ වන්නෙහි ද?අදාල නෛතික ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

   (ලකුණු 100)

2. **(අ) හෝ (ආ) කොටසට පමණක් පිළිතුරු සපයන්න.**

**(අ)** සීලන් යනු බහුවාර්ගික රාජ්‍යයකි. සීලන් වෙත ස්වාධීනතාවය ප්‍රදානය කිරීමට පෙර බ්‍රිතාන්‍යයන් විසින් සම්පාදනය කරනු ලැබූ 1945 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, වෙනස්කොට සැලකීමට ලක් කරන ආකාරයේ ව්‍යවස්ථා සම්පාදනය කිරීම තහනම් කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන ව්‍යවස්ථාව, කවර වූ හෝ ආගමක් නිදහසේ ඇදහීම තහනම් කරන හෝ සීමා කරන ආකාරයේ නීති, අන් ප්‍රජාවන්ට හෝ ආගම්වලට අයත් පුද්ගලයන්ට නොමැති ආකාරයේ අශක්නුතාවයකට හෝ සීමා කිරීමට කවර වූ හෝ ප්‍රජාවකට හෝ ආගමකට අයත් තැනැත්තන් ලක්කරන ආකාරයේ සහ, අන් ප්‍රජාවන්ට හෝ ආගම්වලට අයත් තැනැත්තන්ට ලබාදී නොමැති විශේෂ වරප්‍රසාදයක් හෝ වාසියක් කවර හෝ ප්‍රජාවකට හෝ ආගමකට

අයත් පුද්ගලයන්ට ලබා දෙන ආකාරයේ නීති සම්පාදනය කිරීමෙන් ව්‍යවස්ථාදායකය වළක්වාලනු ලබයි.

වර්ෂ 1965 දී, සීලන් පාර්ලිමේන්තුව විසින්, බිංදු ආගමික ප්‍රජාවගේ වාර්ෂික උත්සවය තහනම් කිරීමට සහ සීලන් හී මධ්‍යම ප්‍රදේශයේ වාසය කළ මොරාන් ජනකණ්ඩායම ස්වකීය නිජභූමිය වෙත පිටුවහල් කිරීම පිණිස වූ නීතීන් ගණනාවක් සම්පාදනය කළේය. මෙම නීති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අගතියට පත් පුද්ගලයින් ගණනාවක් මෙම නීති ප්‍රශ්න කරමින් අභියෝගයට ලක්කළ අවස්ථාවේදී, අගමැතිවරයා මාධ්‍යය හමුවේ ප්‍රකාශ කර සිටියේ සීලන් පාර්ලිමේන්තුව උත්තරීත්‍ර වන බවත් එයට නීති සම්පාදනය කිරීමටත්, නීති පරිච්ඡින්න කිරීමටත් හැකියාව ඇති බවයි.

සීලන් හී ඇතැම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීති විශාරදයන්ගේ මතය වන්නේ, ව්‍යවස්ථාදායකයේ අසීමිත උත්තරීතරත්වය පාලනය කිරීම පිණිස වන යාන්ත්‍රණයක් සහිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සීලන් සම්මත කරගතයුතු බවයි.

ඉහත තත්වය පිළිබඳව අදහස් දක්වමින් ලිපියක් ලිවීමට ඔබට ආරාධනා කර ඇත. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් උදාහරණ දෙමින් ලිපිය ලියන්න.

(ලකුණු 100)

(ආ)ඓතිහාසිකව ගත්කල, පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය සංකල්පය පරිසමාප්ත (absolute) ලෙස සලකන ලදී. අද, බොහෝ විශාරදයින්ගේ මතය වන්නේ සෙසු නිශ්චිත ආණ්ඩුක්‍රමව්‍යවස්ථා සංකල්පයන්ගේ බිහිවීමත් සමග, සම්ප්‍රදායික පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය සංකල්පය ප්‍රායෝගික නොවන බවයි.

ඔබ එකගවන්නෙහිද? ශ්‍රී ලංකාවේ 1972 සහ 1978 ජනරජ ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවන් ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 100)

3. කමල් මෙගාලන්තයේ සිවිල් අයිතිවාසිකම් ක්‍රියාකාරිකයෙකි. ඔහු සහ ඔහුගේ මිතුරන් ආණ්ඩුවේ ප්‍රතිපත්තීන් සහ ක්‍රියාවන් පිළිබඳ තමන්ගේ විරෝධතාවය පළකිරීම පිණිස මෙගාලන්තයේ අගනගරයේ ප්‍රධාන දුම්රිය ස්ථානය අසළ විරෝධතාවයක් සංවිධානය කළහ. ජොෂ්ඨ පොලිස් නිලධාරිවරයෙක් ඔවුනට වහාම ඉවත්ව යන ලෙස අණ කළේය. ඔහු ප්‍රකාශ කර සිටියේ කමල් සහ ඔහුගේ මිතුරන් මෙම විරෝධතාවය සම්බන්ධයෙන් පොලිසියේ පූර්ව අවසරය ලබා ලබාගෙන නොමැති බවයි. විරෝධතාකරුවන්, සාමකාමි රැස්වීමක් සඳහා එලෙස පූර්ව අවසරයක් ලබා ගැනීම අවශ්‍ය නොවන බව කියමින් ඔවුන්ගේ විරෝධතාවය දිගටම පවත්වාගෙන යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස කමල් සහ තවත් දෙදෙනෙකුව පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදී. ඔවුන්ව අත්අඩංගුවට ගැනීම සඳහා කිසිදු හේතුවක් ලබා නොදුන් අතර, මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් නොකර රාත්‍රීන් තුනක් ඔවුනව පොලිස් භාරයේ රදවාගෙන තබන ලදී. ඇතැම් විරෝධතාකරුවන් මේ පිලිබදව සමාජ මාධ්‍ය ජාලාවන් හී පළ කරන ලදී. හතරවන දිනයේදී කමල්ව මහේස්ත්‍රාත්වරයා ඉදිරියට ඉදිරිපත් කළ අතර ඔහුට ඇප ලබා දෙන ලදී. එසැනින් කමල් රෝහල්ගත වන ලදී. කමල් කියා සිටින්නේ පොලිස් රදවුම් භාරයේ සිටිනා විට ඔහුට කුරිරු ලෙස පහරදුන් බවත් පරුෂවචනයෙන් බැනවැදුන බවත්ය.

මේ අතරතුර, ආර්ථික අපහසුතා හේතුවෙන්, කමල්ගේ නැගණිය වන කෝමලී ට නව පාසල්වාරය සඳහා අවශ්‍ය කරන පොත් මිලදී ගැනීමට කමල්ගේ දෙමාපියන් අසමත් වේ. නව පාසල් වාරය ආරම්භයේදී පසුගිය වසර සඳහා පාසල් ගාස්තු ගෙවා නොතිබීම හේතුවෙන පන්තිභාර ගුරුතුමිය විසින් ඇයව නැවත් හරවා ගෙදර එවා තිබේ. විදුහල්පතිවරයා විසින් තරයේ කියා සිටින්නේ ඇය නැවත පාසලට පැමිණීමට පෙර එකී ගාස්තු ලෙවා අවසන් කළ යුතු බවයි. විදුහල්පතිවරයා විසින්, කෝමලී වෙත ලැබෙමින් තිබූ අඩු ආදායම් ශිෂ්‍යත්වය, ඇයගෙ සොහොයුරාව අත්අඩංගුවට ගෙන ඇති බවත් ඔහු ආණ්ඩු විරෝධි ක්‍රියාකාරකම් හී සැකකරුවකු වේ යන පදනම මත, නවත්වා ඇත. කමල් ඔහුගේ සහ ඔහුගේ සොයුරියගේ අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බව පවසමින් ඔබගේ උපදෙස් පතයි.

කමල්ට උපදෙස් දෙන්න. මෙගාලන්තයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව උපකල්පනය කරන්න.

(ලකුණු 100)

4. <u>(අ) සහ (ආ) කොටස් දෙකටම</u> පිළිතුරු සපයන්න.

කුමානෝ යනු ඩොංගා හී ජනාධිපතිවරයාය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, ඩොංගා හී ශ්‍රේෂ්ඨාධිකරණයට අගවිනිසුරු සහ විනිසුරුවරුන් පත්කරනු ලැබිය යුත්තේ ජනාධිපතිවරයා විසිනි.

කුමානෝ විසින් මෑතකදී ඔහුගේ සහෝදරයා වන ජුබානෝ ව ඩොංගා හී ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් වශයෙන් පත් කරන ලදී. නීති විශාරදයින් තර්ක කර සිටින්නේ මෙම පත් කිරීම අත්තනෝමතික සහ අධිකරණ ස්වාධීනතාවය හැල්ලුවට ලක්කරන්නක් වන බවයි. තවද, ඩොංගා හී අගවිනිසුරුවරිය වන ටියාරා විසින්, ජනාධිපති මන්දිරයේ පැවති නිල හමුවීමකදී ජනාධිපතිවරයාට මෙකී පත් කිරීම පිළිබඳ ස්වකීය නොසතුට පළකර ඇති බවට මාධ්‍ය වාර්තාවක් පළවිය. ඊළඟ දිනයේදී, මධ්‍ය සාකච්ඡාවේ දී මෙකී මාධ්‍ය වාර්තාව කුමානෝ විසින් ප්‍රතික්ෂේප කළ අතර, ඔහු ප්‍රකාශ කර සිටියේ කවර හෝ විනිශ්චයකාරවරයෙකු ගේ එකී ආකාරයේ හැසිරීමක් ඔහු විසින් නොඉවසන අතර එසේ වූමහොත්, වහාම ක්‍රියාත්මක වන පරිදි ඔවුන් තනතුරෙන් නෙරපා දමන බවයි.

(අ) ඩොංගා හී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව උපකල්පනය කරන්න. ජුමානෝගේ පත්කිරීමෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලබව සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ වෙනත් අදාල නෛතික අධිකාරීන් ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු 50)

(ආ) අධිකරණ ස්වාධීනතාවයට අදාල මූලධර්ම ඇසුරින් මාධ්‍ය සාකච්ඡාවේ දී කුමානෝ විසින් සිදුකළ ප්‍රකාශයේ බලපෑම සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ වෙනත් අදාල නෛතික අධිකාරීන් ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු 50)

5. ආණ්ඩුවේ බලතල අවභාවිතා කිරීම අවම කිරීම පිණිස වන සුදුසු ම මාර්ගය වන්නේ එකී බලතල මත දෘඪ සහ විනිවිදභාවයෙන් යුතු සංවරණයන් පැනවීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මෙය, බලතල බෙදීමේ සංකල්පය හරහා අත්පත් කර ගැනීමට අරමුණු කරයි.

ඔබ එකගවන්නෙහිද? ඉහත ප්‍රකාශය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවධානය යොමුකරමින් සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර සුදුසු උදාහරණ සහ මෑතකාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ඇසුරින් තහවුරු කළ යුතුය.

(ලකුණු 100)

6. ප්‍රශ්නයේ <u>කොටස් හතරට ම</u> පිළිතුරු සපයන්න.

රාමේන් සහරා හී විධායක ජනාධිපතිවරයා වන අතර සහරා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බවට උපකල්පනය කරන්න.

(අ) අධිකරණය විසින් මිනීමැරීමක් සඳහා වරදකරු කරසිටි ස්වකීය මස්සිනාට රාමෙන් විසින් ජනාධිපති සමාව පිරිනමන ලදී. මෙම ජනාධිපති සමාව ලබා දීමට පෙර රාමෙන් විසින්, මෙම නඩුව විනිශ්චය කළ විනිසුරුවරයාගේ වාර්තාවක් ලබා ගත්තේ නැත. (ලකුණු 25)

(ආ) රාමේන් ස්වකීය කැබිනට් මණ්ඩලය සඳහා ඒකපාර්ශවික ලෙස අමාත්‍යවරුන් පත්කරයි. විපක්ෂ නායකයා වන සුමෝ කියා සිටින්නේ මෙම ක්‍රියාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය යටපත් කරන බවයි. (ලකුණු 25)

(ඇ) රාමෙන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය රහිතව ස්වකීය මාමා ව සහරා හී මහා බැංකුවේ අධිපතිවරයා ලෙස පත්කළේය. (ලකුණු 25)

(ඈ) සහරා හී මහාමැතිවරණය 2022 අගෝස්තු 14 වන දින පවත්වන ලදී. කෙසේවුවද, තමන් පාර්ලිමේන්තුවේ බහුතර බලය අහිමිකරගෙන ඇති බව අවබෝධකරගත් රාමේන් වහා ක්‍රියාත්මක වන පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී.

(ලකුණු 25)

ඉහත අවස්ථාවන්හි දී රාමේන් ගේ ක්‍රියාවන්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූභාවය පරීක්ෂා කරන්න.ඔබගේ පිළිතුරු හේතු සහ අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන මගින් තහවුරු කරන්න.

******************************